## පශු සම්පත් සංවර්ධනය

පෝෂණ අවශ්‍යතා සපුරා ගැනීමට ද පොහොර ලබා ගැනීමට හා වී ගොවිතැන් කටයුතු සඳහා ද විශේෂයෙන් ගව සම්පත දියුණු කිරීම අවශ්‍ය විය.

- 1948 - 57 දස අවුරුදු යෝජනා ක්‍රමය අනුව මෙරටට අවශ්‍ය කිරි සපයා ගැනීමේ දී ආනයන මත රඳා පැවතීම අඩුකිරීම කෙරෙහි අවධානය යොමු කර තිබිණි.
- 1970 - 76 කාලයේ දී දැඩි ලෙස ආනයන පාලනය කිරීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම හේතු කොට ගෙන කිරි නිෂ්පාදන අතින් ස්වයංපෝෂිත වීම සඳහා ගවයන් සංඛ්‍යාව වැඩි කිරීමට පියවර ගනු ලැබී ය.
- ජාතික කිරි මණ්ඩලය පිහිටු වීම ද පශු සම්පත් සංවර්ධනය කිරීමෙහි ලා වැදගත් සිදු වීමකි. අඹේවෙල කිරි කම්හල හා පොළොන්නරුව උකු කිරි කම්හල පිහිටුවා කිරි සම්පාදනය දියුණු කිරීමට පුළුල් පියවර ගනු ලැබී ය.
- අඩු මිලට උසස් තත්ත්වයේ සත්ත්ව ආහාර නිපදවීම සඳහා ලංකා තෙල් හා මේද සංයුක්ත මණ්ඩලය පිහිටු විය. 1973 පශු සම්පත් මණ්ඩලය පිහිටු වීමෙන් අනතුරු ව පසු සම්පත් සංවර්ධන කටයුතු කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතට පත් කළ නමුත්, 1978 දී සත්ත්ව නිෂ්පාදන කටයුතු ග්‍රාමීය සංවර්ධන අමාත්‍යංශය යටතට පත් කොට ගනු ලැබී ය.

## ධීවර කර්මාන්තය

ශ්‍රී ලංකාව වටා ඇති මහා සාගරය ද, මධ්‍යම කඳුකරයෙන් ආරම්භ වී සෑම දිශාවකට ම ගලා බස්නා ගංගා රාශිය ද අභ්‍යන්තර වැව් සහ ජලාශ ද ධීවර කර්මාන්තයට ලැබී ඇති මහත් ආශිර්වාදයකි. 1948 න් පසු ජනතාවගේ පෝෂණ ඌනතා දුරුකිරීමටත් රැකියා හිඟයට පිළියම් වශයෙනුත් ධීවර කර්මාන්තය දියුණු කිරීම කෙරෙහි උනන්දුවක් දැක්වීමට පෙලඹී ඇත. 1959 - 1968 දස අවුරුදු සැලැස්ම හා 1972 - 76 පස් අවුරුදු සැලැස්ම තුළින් ධීවර කර්මාන්තය නඟා සිටුවීමට විවිධ පියවර රාශියක් ගෙන ඇත.

## 1964 ධීවර සංස්ථාව පිහිටුවීම

මාළු මිලදී ගැනීම - බෙදා හැරීම - ගබඩා කිරීම පැරණි බෝට්ටුවලට මෝටර් සවි කිරීම මඟින් බෝට්ටු යාන්ත්‍රීකරණය කිරීම ධීවර ආම්පන්න නවීකරණය කිරීම සඳහා සහනදායි ණය ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම, ධීවර කටයුතු සඳහා ව්‍යාප්ති නිලධාරීන් බඳවා ගැනීම වැනි පියවර මඟින් ධීවර කර්මාන්තය නඟා සිටුවීමට රජය මැදිහත් විය.

1970 මුල් කාලයේ දී ඉස්සන් හා පොකිරිස්සන් අපනයනය මගින් විදේශ විනිමය උපයා ගැනීමේ කටයුතු දියත් කෙරිණි.

රජයේ මඟ පෙන්වීම යටතේ ධීවර සමුපකාර සමිති පිහිටුවනු ලැබිණි. ආසියානු සංවර්ධන බැංකුවෙන් ලබාගත් ණය ආධාර යොදාගෙන බෝට්ටු යාන්ත්‍රීකරණය කිරීම සඳහා සහනදායී ණය ආධාර ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. ඒ අතර ධීවරයන්ට වෙනත් සහනාධාර ද ලබාදීමට පියවර ගැනිණි. ඒ යටතේ,

ෆයිබර් ග්ලාස් බෝට්ටු හඳුන්වා දීම,

ධීවර යාත්‍රාංගනා සංඛ්‍යාව වැඩි දියුණු කිරීම,

ධීවර සමුපකාර මගින් ධීවරයන්ට මූල්‍ය ආධාර ලබා දීම යනාදිය ප්‍රධාන වේ.

තවද බෝට්ටු හා ඔරු සඳහා දෙන ලද ආධාර ප්‍රමාණය ද 90% දක්වා වැඩි කරන ලදී. මේ සියලු ආධාර හේතු කොට ගෙන වයඹ, දකුණ සහ බස්නාහිර පළාත්වල වෙරළ ආශ්‍රිත ව ධීවර කර්මාන්තය දියුණු විය. ධීවර ආම්පන්න මිල දී ගැනීම සඳහා අවශ්‍ය මූල්‍ය ආධාර මහජන බැංකුව මඟින් ලබා දීම සිදු විය. 1972 ලංකා ධීවර වරාය පිහිටු වීම මඟින් යටිතල පහසුකම් දියුණු කිරීම හා ඒවා කළමණාකරණය කිරීම කෙරෙහි අවධානය යොමු කෙරිණි.

මෙම විවිධ පියවර ශ්‍රී ලංකාවේ කරදිය ධීවර කර්මාන්තයේ දියුණුවට මහත් පිටිවහලක් විය. 1952 ධීවර දෙපාර්තමේන්තුව මිරිදිය මසුන් බෝ කිරීමේ මධ්‍යස්ථාන රාශියක් පිහිටු වීම රට අභ්‍යන්තර ප්‍රදේශවල මත්ස්‍ය අවශ්‍යතා සපුරාලීමට උපකාරී විය.

## රාජ්‍ය ව්‍යවසාය

මහජනයාට වැඩි සේවයක් සැලසීමට ද සේවකයන්ගේ ශුභ සිද්ධිය සලසා දීම ද අරමුණු කොට ගෙන ව්‍යාපාර ජනසතු කිරීම ආරම්භ කරන ලදී. ඒ අනුව 1956 දී බණ්ඩාරනායක මහතාගේ රජය යටතේ වරාය හා බස් ගමනාගමනය ජනසතු කරනු ලැබී ය. බණ්ඩාරනායක මහතා ආරම්භ කළ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිපත්තිය වඩාත් පුළුල් ලෙස ක්‍රියාත්මක කෙළේ (1960 - 64) කාලය තුළ අගමැති තනතුර දැරූ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය විසිනි.

1961 ජුලි 1 වන දින මහජන බැංකුව පිහිටු වීම රාජ්‍ය ව්‍යවසාය කටයුතුවල ඉතා පුළුල් ඉදිරි පියවරකි. එමඟින් කම්කරුවන්ට පවා ණය පහසුකම් ලබා දීම සිදු විය. එපමණක් ද නොව ජාතික සංවර්ධනයට අත්‍යවශ්‍ය සාධකයක් වූ ඉතිරි කිරීම්වලට යොමු කිරීම සහ පොදු ජනතාවට බැංකු ගනුදෙනු පහසුකම් ලැබීම ද මහජන බැංකුව ආරම්භ කිරීමෙන් ඇති වූ ප්‍රතිඵල කිහිපයකි.

අනතුරු ව ලංකා බැංකුව ජනසතු කිරීම ද සිදු විය. 1960 නොවැම්බර් 17 වන දින ශ්‍රී ලංකාවේ රක්ෂණ ව්‍යාපාර ජනසතු කොට රක්ෂණ සංස්ථාව පිහිටුවනු ලැබිණි.

බටහිර විදේශීය සමාගම් සතු ව පැවති පෙට්‍රල් හා භූමිතෙල් බෙදා හැරීමේ ව්‍යාපාරය ජනසතු කිරීම නිසා පිටරටට ඇදී ගිය විශාල ධනයක් මේ රටේ නතර කර ගැනීමට හැකි විය. ජනසතු කිරීමෙන් පසු ව එම ව්‍යාපාරික කටයුතු කරගෙන යෑම සඳහා "පෙට්‍රෝලියම් කෝපරේෂන්" හෙවත් ඛනිජ තෙල් නීතිගත සංස්ථාව පිහිටුවිය.

සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ පාලන කාලයේ දී මෙරට පාරිභෝගික භාණ්ඩ අලෙවිය සඳහා රජය මැදිහත් විය. ඒ සඳහා රජයේ අනුග්‍රහය යටතේ 1971 දී සමුපකාර සමිති ප්‍රතිසංවිධානය කොට, ඒවා ශක්තිමත් කිරීමට පියවර ගැනිණි. ඊට අමතර ව සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව පිහිටුවිය. පාරිභෝගික භාණ්ඩ බෙදා හැරීමේ කාර්යය ද විශාල වශයෙන් රජය යටතට පත් කොට ගැනිණි.

ඉහත පිටුවක දී සඳහන් කළ පරිදි රන් පවුම් සමාගම් සතු ව පැවැති තේ, පොල් රබර් වතු ජනසතු කිරීම නිසා ශ්‍රී ලංකාවට විශාල ආර්ථික වාසි භුක්ති විඳීමට හැකි විය. ඊට අමතර ව විදේශීන් විසින් කොල්ල කාගෙන තිබූ මෙරට සෑම බිම් අඟලක් ම, යළි පොදු ජනතාව අතට පත් කිරීම සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ පාලන සමයේ ක්‍රියාත්මක කළ ඉඩම් ප්‍රතිසංස්කරණය මගින් සිදු කෙරිණි.

## කර්මාන්ත

බ්‍රිතාන්‍ය යුගයේ කර්මාන්ත දියුණු කිරීමට වැඩි අවධානයක් යොමු නො වී ය. බ්‍රිතාන්‍යයන්ගේ අභිප්‍රාය වූයේ ශ්‍රී ලංකාවෙන් අමුද්‍රව්‍ය ලබාගෙන, මව්රට විසින් නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ අලෙවි කිරීමට වෙළෙඳපොළක් ලෙස ශ්‍රී ලංකාව පවත්වාගෙන යාම යි. මේ හේතුවෙන් අතීතයේ ශ්‍රී ලංකාවේ පැවති බොහෝ කර්මාන්ත ද බ්‍රිතාන්‍ය යුගයේ දී පිරිහී ගියේ ය. බ්‍රිතාන්‍ය යුගයේ ප්‍රධාන වශයෙන් තේ, පොල්, රබර් සඳහා අවශ්‍ය යාන්ත්‍රික කොටස් හා උපාංග සැපයීම අරමුණු කොටගෙන ලුහු කර්මාන්ත කීපයක් වතු වගා ප්‍රදේශ ආශ්‍රිත ව ව්‍යාප්ත කොට තිබිණි. ගෘහ කර්මාන්ත සහ කුඩා කර්මාන්ත මගින් පාරිභෝගික භාණ්ඩ, ගෘහ උපකරණ නිෂ්පාදනය, අමුද්‍රව්‍ය හා පුහුණු ශ්‍රමය පදනම් කොට ගෙන ප්‍රාදේශීය ව්‍යාප්තියක් දක්නට ලැබිණි.

මහාපරිමාණ කර්මාන්ත ස්වල්පයක් අමුද්‍රව්‍ය පදනම් කොට ගෙන කොළඹින් බැහැර ව ස්ථානගත විය. නිදහසින් පසු මුල් යුගයේ මහාමාර්ග, දුම්රිය මාර්ග, වරාය වැනි යටිතල පහසුකම් වර්ධනය වීම ද මධ්‍යම හා ඉහළ ආදායම් හිමිකරුවන් කොළඹ දිස්ත්‍රික්කය තුළ සංකේන්ද්‍රණය වී සිටීම වැනි කරුණු ද මුල්කොට ගෙන කොළඹ නගරය වටා පෞද්ගලික ආයෝජකයෝ කර්මාන්ත ආරම්භ කළහ. එකල කර්මාන්ත ස්ථානගත වීම පිළිබඳ ව ජාතික ප්‍රතිපත්තියක් නො වී ය.

1952 ලෝක බැංකු වාර්තාව හා රාජ්‍ය කාර්මික ව්‍යාපාර කොමිසමේ වාර්තාව රජයේ කාර්මික ප්‍රතිපත්ති සකස් කිරීමේ ලා ප්‍රයෝජනයට ගැනිණි. ලෝක බැංකුව විසින් මධ්‍යම පරිමාණ කර්මාන්ත ඇරඹීමේ වැදගත්කම ද පෙන්වා දෙන ලදී.

## 1955 රාජ්‍ය සංස්ථා පනත

රාජ්‍ය කාර්මික ව්‍යාපාර කොමිසමේ වාර්තාවට අනුව රාජ්‍ය ව්‍යාපාර සංවිධානය හා කළමනාකරණය දියුණු කිරීමේ අරමුණින් රජයේ දෙපාර්තමේන්තු යටතේ පැවති කර්මාන්තශාලා සංස්ථා බවට පත් කරනු ලැබී ය. 1955 ධවල පත්‍රිකාව මඟින් විදේශීය සහ පෞද්ගලික ආයෝජන පිළිබඳ රජයේ ප්‍රතිපත්තිය ප්‍රකාශයට පත් විය. 1957 කාර්මික සංස්ථා පනත මඟින් ඕනෑ ම කාර්මික ව්‍යාපාරයක් ආරම්භ කිරීමට හා පවත්වාගෙන යාමට රජයට බලය ලැබිණි. 1959 ශ්‍රී ලංකාවේ ප්‍රථම කාර්මික ජනපදය ඒකල පිහිටුවනු ලැබිණි. කොළඹ වටා පමණක් පැවති යටිතල පහසුකම් අවට ප්‍රදේශවල ද පැතිරී යාම එමඟින් ඇරඹිණි.

1960 රත්මලාන කාර්මික ජනපදය පිහිටු වීම නිසා කොළඹට ආසන්න ප්‍රදේශවල ද කර්මාන්ත ආරම්භ කිරීම කෙරෙහි අවධානය යොමු විය.

1958 - 68 දස අවුරුදු යෝජනා ක්‍රමය යටතේ මහා පරිමාණ, සුළු පරිමාණ හා ගෘහ කර්මාන්ත දියුණු විය.

### මහා පරිමාණ කර්මාන්ත

අමුද්‍රව්‍ය සහ ඉඩම් ලබා ගැනීමේ පහසුව මෙන් ම ජනතාව කොළඹින් බැහැර ව වාසය කිරීමේ අවශ්‍යතාව වැනි සාධක මුල් කොට ගෙන මහා පරිමාණ කර්මාන්ත ආරම්භ කරනු ලැබී ය. පිඟන්, ටයර්, සිමෙන්ති, කඩදාසි, සීනි, තුනී ලෑලි, යකඩ, රසායනික ද්‍රව්‍ය, ලෝහ, රෙදිපිළි, වානේ යනා දී කර්මාන්ත රජයේ ව්‍යාපාර ලෙස ආරම්භ කරනු ලැබිණි. ඒවා සියල්ල ම පාහේ ආරම්භ කරනු ලැබුවේ විදේශ ආධාර ලබා ගැනීමෙනි.

## සෞඛ්‍ය සේවය

නිදහස ලැබීමට පෙර සිට ම ශ්‍රී ලංකා රජය නොමිලේ සෞඛ්‍ය පහසුකම් සලසා තිබිණි. එහෙත් එම පහසුකම් සීමිත වුවා මෙන් ම කොළඹ නගරය කේන්ද්‍රය කොට ගෙන පැවතිණි. වැඩි පහසුකම් නාගරික ප්‍රදේශවල පැවති අතර ගම්බද ප්‍රදේශවලට අවම පහසුකම් හෝ ලැබුණේ කලාතුරකිනි.

නිදහසින් පසු නගරබද ව මෙන් ම ගම්බද ව සෞඛ්‍ය පහසුකම් නංවාලීමට පියවර ගනු ලැබී ය. ඒ අනුව සෞඛ්‍ය අමාත්‍යාංශය, කාන්තා කටයුතු හා ශික්ෂණ රෝහල් අමාත්‍යාංශය, ස්වදේශීය වෛද්‍ය අමාත්‍යාංශය වැනි අමාත්‍යාංශය කීපයක් යටතේ මහජනතාවට යහපත් සෞඛ්‍ය මට්ටමක් ලබා දීමට කටයුතු කොට ඇත.

1950 දළ දේශීය නිෂ්පාදනයෙන් සෞඛ්‍ය කටයුතු සඳහා රජයේ වියදම් 1.5% වූ අතර 1970 දී එය 2.1% දක්වා වැඩි විය.

මහජන සෞඛ්‍ය කටයුතු සඳහා රජය වැඩි අවධානයක් යොමු කොට ඇති බව ඉන් පැහැදිලි වේ. පසුගිය වසර පනහ තුළ ද සෞඛ්‍ය යටිතල පහසුකම් හා සේවා සැපයීම පුළුල් වූ අතර රෝහල් පද්ධතිය, සෞඛ්‍ය සේවා කටයුතුවල නිරත වූ මිනිස් බලය, වෛද්‍ය උපකරණ, විශේෂඥ සේවා, විශේෂ ශල්‍ය කර්ම පහසුකම් පවුල් සෞඛ්‍ය සේවා හා සෞඛ්‍ය අධ්‍යාපනය වැනි බොහෝ ක්ෂේත්‍ර පුළුල් වී ඇති බව පැහැදිලි ය.

පුළුල් ලෙස ව්‍යාප්ත වූ ප්‍රතිශක්තිකරණ එන්නත් ලබා දීමේ වැඩසටහන යටතේ මාස 12ට අඩු ළමයින්ගෙන් 90% වැඩි කොටසකට ප්‍රතිශක්තිකරණ එන්නත් ලබා දීම සමඟ බාලක පක්ෂඝාත, ගලපටලය, කක්කල් කැස්ස, පිටගැස්ම, සරම්ප වැනි රෝග වැළඳීමේ ප්‍රමාණය තියුණු ලෙස පහත වැටීමක් සිදු විය.

1970 වන විට කොලරාව ශ්‍රී ලංකාවෙන් මුලිනුපුටා දැමීමට හැකි විය. උණ සන්නිපාතය, බරවා, මැලේරියාව, ක්ෂය රෝගය වැළඳුණු රෝගීන් සංඛ්‍යාව බෙහෙවින් පහත වැටීම විශේෂ ලක්ෂණයකි. 1946 ක්ෂය රෝගයෙන් මියගිය රෝගී සංඛ්‍යාව 9250 කි. 1965 දී එම රෝගයෙන් මියගිය කිසිවකු ගැන හෝ වාර්තා නොවී ය. මව්වරුන්, ළදරුවන්, පාසල් ළමයින් සඳහා අතිරේක ආහාර ලබා දීමේ වැඩ සටහන්, දන්ත සෞඛ්‍ය සේවා ඇතුළු පාසල් සෞඛ්‍ය වැඩ සටහන් ආදිය ද සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ප්‍රගතියට හේතු විය.

1972 පවුල් සෞඛ්‍ය කාර්යාංශය පිහිටු වූ අතර එමගින් මාතෘ හා ළමා සෞඛ්‍ය සේවා පවුල් සංවිධානය හා සෞඛ්‍ය අධ්‍යාපන කටයුතු පිළිබඳ විවිධ පියවර ගැනීම ද සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ප්‍රගතියට හේතු විය.

1972 රාජ්‍ය ඖෂධ සංස්ථාව පිහිටු වීමෙන් සාධාරණ මිලකට ඖෂධ ගැනීමේ හැකියාව ලැබිණි.

**දකුණු ආසියාවේ ඉහළ ජීවන අපේක්ෂාව සහ අඩුම ළදරු මරණ අනුපාතිකයක් ශ්‍රී ලංකාවෙන් වාර්තා වේ.**

## ප්‍රවාහන

කාර්යක්ෂම ප්‍රවාහන සේවය රටක ආර්ථික තත්ත්වය නංවාලයි. එමෙන් ම ජනතාවට යහපත් සේවයක් ලබා දීම මගින් ජනතාවගේ ජීවිතය පහසු කරවයි.

බ්‍රිතාන්‍ය යුගයේ සිට ශ්‍රී ලංකාවේ මහාමාර්ග, දුම්රිය මාර්ග, මෙන් ම වරායන් ද දියුණු මට්ටමක පැවතිණි. නිදහසින් පසුව ප්‍රවාහන සේවය සඳහා ඉල්ලුම වැඩි වීමත් සමඟ ප්‍රවාහන පද්ධතිය විශාල වශයෙන් ප්‍රසාරණය විය.

## මහාමාර්ග

නගර හා ග්‍රාමීය ප්‍රදේශ එකට යා කිරීමට මාර්ග පද්ධතිය බෙහෙවින් හේතු වූ සාධකය විය.

1948 බස් සමාගම් 53ක් මගින් මහාමාර්ග ප්‍රවාහනය පවත්වාගෙන යනු ලැබී ය. රජය මගින් ගාස්තු නියම කරන ලදී. 1958 ජනවාරි පළමුවන දින පෞද්ගලික බස් මගී ප්‍රවාහන සේවය රජයට පවරා ගන්නා ලදී. මේ අනුව රට තුළ මගී ප්‍රවාහන බස් සේවය පවත්වාගෙන යාමේ තනි අයිතිය, ලංකා ගමනාගමන මණ්ඩලයට (ලංගම)පවරා දෙනු ලැබී ය. 1978 මෙම ලංගම අහෝසි කරන ලද අතර, ශ්‍රී ලංකා මධ්‍යම ගමනා ගමන මණ්ඩලය ආරම්භ විය. ඒ අනුව මගී ප්‍රවාහන සේවය ප්‍රධාන වශයෙන් නැවත පෞද්ගලික බස් හිමියන් වෙත පැවරුණ අතර ශ්‍රී ලංකා මධ්‍යම ගමනා ගමන මණ්ඩලය විසින් ද ඉතා සීමිත සේවාවක් සපයනු ලැබේ.

පාසල් සිසුන් සඳහා වාර ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම අඛණ්ඩ ව (1948 - 77) දක්වා පැවතීම වැදගත් ශුභසාධන කටයුත්තක් ලෙස දැක්විය හැකි ය.

## දුම්රිය ගමනාගමනය

බ්‍රිතාන්‍ය යුගයේ ඇරඹි දුම්රිය ගමනාගමන කටයුතු නිදහසින් පසු රජයේ වගකීමක් ලෙස පවත්වා ගෙන යනු ලැබේ. 1948 තෙක් පැවැති ගල් අඟුරු දුම්රිය වෙනුවට ඩීසල් ඇන්ජිම හඳුන්වා දීම කාර්යක්ෂමතාව වැඩි වීමට හේතු විය. දුම්රිය මැදිරි නවීකරණය කිරීම, නගරාන්ත දුම්රිය, ශීඝ්‍රගාමී දුම්රිය, නිරීක්ෂණ මැදිරි සහිත දුම්රිය පවත්වා ගැනීම යනාදිය මඟින් ගමනාගමන පහසුකම් වැඩි දියුණු වී ඇත. මාර්ග සංඥා පද්ධති මෙම සේවය කාර්යක්ෂම කිරීමට බලපා ඇත. වාර ප්‍රවේශ පත්‍ර මගින් මහජන සුභසාධන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වේ. 1956 දී උඩරට මැණිකේ, රුහුණු කුමාරි, පොඩි මැණිකේ, යාල් දේවි සහ වෙනත් දුරස්ථ දුම්රිය සේවා හඳුන්වා දෙන ලදී.

## වරාය

බ්‍රිතාන්‍ය සමයේ කොළඹ වරාය ගොඩනංවනු ලැබිණි. 1948 වන විට ලෝකයේ ප්‍රධාන වරායන්ගෙන් එකක් බවට කොළඹ වරාය පත් විය. (1950-65) වරාය සංවර්ධන යෝජනා රාශියක් ක්‍රියාත්මක විය.

- එලිසබෙත් ජැටිය, බණ්ඩාරනායක ජැටිය, විජය ජැටිය, දකුණු පාලම, උතුරු පාලම යනාදී නැව් නැංගුරම් පොළවල් වැඩි දියුණු කරන ලදී. ඒ හේතු කොට ගෙන මේ වකවානුව තුළ රජය විශාල ලාභ ඉපයීමට සමත් වී ඇත.
- 1958 දී  වරාය ජනසතු කරන ලදී.
- 1960 සිට සිත් ගන්නා සුලු සුබසාධන රැසක් ලබාදීම මගින් බොහෝ  කම්කරු ගැටලු විසඳනු ලැබිණි.
- 1964 දී නැවක් වරාය තුළ ගත කරන කාලය දින  10ක්  ලෙස සටහන් වූ අතර 1973 එම දින ගණන 3 දක්වා අඩු කිරීමට සමත් වීම හේතු කොට ගෙන ලාභ ඉපයීම වැඩි කොට ගත හැකි විය. ඉහළ කාර්යක්ෂමතාවක් ප්‍රදර්ශනය කෙරිණි.
- 1970 වරාය අධිකාරිය පිහිටුවීම තුළින් කාර්යක්ෂමතාව වැඩි වූ බව පෙනේ.
- 1973 පිහිටු වූ මධ්‍යම නැව් බඩු සංස්ථාව වරාය කටයුතු දියුණුවට බෙහෙවින් උපකාරී විය.

රටක ආනයන අපනයන දියුණුවට කාර්යක්ෂම වරාය අත්‍යවශ්‍ය සාධකයක් නිසා එහි පැවැත්ම ගැන 1948 සිට සෑම රජයක් ම  සිය අවධානය යොමු කර ඇත.

## සන්නිවේදනය

ප්‍රධාන සන්නිවේදන මාධ්‍ය වන තැපැල්, විදුලි සංදේශ, දුරකථන යනාදී සේවා ගැන අධ්‍යයනය කරමු.

## තැපැල් සේවය

බ්‍රිතාන්‍ය අධිරාජ්‍ය පාලකයන් විසින් ආරම්භ කරන ලද තැපැල් සේවය අද දක්වා අඛණ්ඩ ව පවතී. 1948 ලියුම් බෙදාහැරීමට තැපැල් දෙපාර්තමේන්තුව විසින් වෑන්රථ සේවාවක් හඳුන්වා දෙන ලදී.

- 1949 කොළඹ සහ යාපනය නගරය අතර ගුවන් තැපැල් සේවාවන් ආරම්භ කරනු ලැබී ය.
- 1949 රජයේ විශ්‍රාම වැටුප් ගෙවීම තැපැල් කාර්යාල මගින් බාරගැනීම, නිසා විශ්‍රාමිකයන්ට මහත් පහසුවක් සැලසිණි.
- 1958 සිංහල අක්ෂර යෙදූ තැපැල් මුද්දරවල පළමු කාණ්ඩය නිකුත් විය.
- 1972 තැපැල් කාර්යාල ජාතික ඉතිරි කිරීමේ බැංකුව ලෙස කටයුතු කිරීම ආරම්භ විය.

බ්‍රිතාන්‍ය යුගයේ සිට අද දක්වා තැපැල් සේවය මහජනතාවට විශාල සේවාවක් ඉටු කරයි. රටේ ඕනෑ ම දුෂ්කර ප්‍රදේශයකට වුව ද ලිපියක් හෝ පාර්සලයක් හෝ ලබා ගැනීමට ද ගම්බද ප්‍රදේශවල ජනතාවට සුළු මුදලක් හෝ ඉතුරුම් වශයෙන් තැන්පත් කිරීමට ද තැපැල් සේවය මගින් ඉටු කරනු ලබන සේවය අති විශාල යි.

## විදුලි සංදේශ

- 1948 ශ්‍රී ලංකාවේ දුරකථන 8625ක් ස්ථාපනය කොට තිබූ අතර ඉන් කොළඹ නගරය පුරා 5079 ක් පිහිටුවා තිබිණි.
- කේබල් හා වයර්ලස් (බ්‍රිතාන්‍යය) සමාගම සතුව පැවති විදුලි සංදේශ සේවය 1951 දී රජයට පවරා ගැනිණි.
- 1963 ටෙලෙක්ස් සේවාව හඳුන්වාදීම සිදු විය.
- 1966 ග්‍රාහක සෘජු දුරකථන ඇමතුම් පහසුකම් ආරම්භ විය.
- 1976 ප්‍රථම පෘථිවි චන්ද්‍රිකා භූවමාරු මධ්‍යස්ථානය පිහිටු වීම නිසා ජාත්‍යන්තර විදුලි සංදේශ පහසුකම් පුළුල් විය.

## ගුවන් විදුලිය

- ශ්‍රී ලංකාවට 1925 දී ගුවන් විදුලිය හඳුන්වා දෙන ලදී.
- 1949 දී ගුවන් විදුලි දෙපාර්තමේන්තුව පිහිටු වීය."රේඩියෝ සිලෝන්" නමින් ජනප්‍රිය වූ එය එක් ගුවන් විදුලි සේවාවක් පමණක් ක්‍රියාත්මක කරන ලදී.
- 1950 ජනවාරි 01 දින නිදහස් චතුරස්‍රයේ නව ගුවන් විදුලි මධ්‍යස්ථාන පිහිටු වූ අතර ගුවන් සේවා පැවැත්වූ කාලය දිගු කරනු ලැබී ය. සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා තුනෙන් ම එකවර ම වැඩසටහන් විකාශය කිරීම සිදු විය.
- 1950 වෙළඳ සේවය ආරම්භ වීමත් සමඟ ස්වදේශිය සේවය සමඟ සමාන්තර ව වැඩ සටහන් විකාශය වීම ද ආරම්භ විය.
- 1951 අධ්‍යාපන සේවා වැඩ සටහන විසුරුවා හැරීම ආරම්භ විය.
- 1967 ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව පිහිටු විය.
- 1979 ප්‍රථම ප්‍රාදේශීය ගුවන් විදුලි සේවාව ආරම්භ කෙරිණි.

නිදහසින් පසු ශ්‍රී ලංකාව ගැන හැදෑරූ ඔබට පහත සඳහන් මාතෘකා ඔස්සේ කරුණු හැදෑරීමට අවස්ථාව ලැබී ඇත්දැ යි බලන්න.

### සාරාංශය

පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වීමට පක්ෂ ක්‍රමයෙන් සහ කැබිනට් මණ්ඩලයෙන් ලැබෙන පිටිවහල. 1972 නව ජනරජ ව්‍යවස්ථාව මහජන ස්වාධිපති බලය සුරක්ෂිත කෙරෙන ව්‍යවස්ථාවක් ලෙස ස්වෛරී නිදහස් රාජ්‍යයක් බිහිකිරීමට හේතු පාදක වූ ආකාරය, 1978 දෙවන නව ජනරජ ව්‍යවස්ථාව තුළින් විධායක ජනාධිපති ධූරය පදනම් වූ ආණ්ඩුක්‍රමය ක්‍රියාත්මක වූ බව, නිදහසින් පසු ශ්‍රී ලංකාවේ අධ්‍යාපන, කෘෂිකර්ම, රාජ්‍ය ව්‍යවසාය, කර්මාන්ත, සමාජ සුභසාධන යන ක්ෂේත්‍රවල ඇති වූ නව ප්‍රවණතා හා ශ්‍රී ලාංකිකයන්ට ඒවායින් ලැබෙන ප්‍රතිඵල යනාදිය පිළිබඳ තොරතුරු ඔබ මෙම පරිච්ඡේදයෙන් ඉගෙන ගන්නට ඇත.

## වැඩිදුර කියවීම් සඳහා

බී. වී. රාවෝ, පරිවර්තනය ඇඳගම මාලනී - ලෝක ඉතිහාසය
(අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව)

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව සම්පාදක - යුරෝපා ඉතිහාසය
(අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව)

ශ්‍රී ලංකාවේ ඉතිහාසය IV වන කොටස - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

ඉතිහාසය 11 වසර - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

සමාජ අධ්‍යයනය හා ඉතිහාසය 10 ශ්‍රේණිය - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

ලංකා ඉතිහාසයේ බ්‍රිතාන්‍ය යුගය - සංස්කරණය ජී. ජී. වී. සෝමරත්න